සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02 යි.

**I** කොටස

සියලු ම ප්‍රශ්නවලට දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි ජාතිකයා වන්නේ ..................................................................... ය. (සීබෙල් ද වාර්ට් / ස්පිල් බර්ජන්)

(02) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට වගා කරන ලද ප්‍රථම ආර්ථික බෝගය වූයේ .................................................... ය. (තේ / කෝපි)

(03) මිෂනාරි පූජකතුමන්ලා සමග පංච මහා වාද පැවැත්වීමේ නායකත්වය ගෙන කටයුතු කළේ .................................................. හිමියන් ය. (මිගෙට්ටුවත්තේ ගුණානන්ද / හික්කඩුවේ ශ්‍රී සුමංගල)

(04) එංගලන්තයේ දෙවන චාල්ස් රජු පෘතුගාලයේ කැතරින් කුමරිය විවාහ කර ගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පෘතුගීසිහු තමන් සතු වූ ...................................................... (බොම්බාය / කල්කටාව) දායාද වශයෙන් ඉංග්‍රීසීන්ට පැවරූහ.

(05) ශ්‍රී ලංකාවට සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කරන ලද්දේ ...................................................... ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය මඟිනි. (ඩොනමෝර්/ කෲව් - මැකලම්)

- **අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති හරිනම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(06) කුණ්ඩසාලේ කුමාරයා නමින් ප්‍රසිද්ධව සිටියේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය. (        )

(07) 1818 පළමු නිදහස් සටනට නායකත්වය දෙනු ලැබුවේ ගොංගාලේගොඩ බණ්ඩා විසිනි. (        )

(08) ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවන සමයේ හින්දු පුනර්ජීවනය සඳහා නායකත්වය ලබා දුන්නේ ආරුමුග නාවලර් තුමාය. (        )

(09) ඉංග්‍රීසීන්ට විරුද්ධව ගෙනයනු ලැබූ ඉන්දියානු සටනේ සිටි ශ්‍රේෂ්ඨතම නායකයා මොහොමඩ් අලි ජින්නා ය. (        )

(10) ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා වූයේ ඩී.එස් සේනානායක මැතිතුමා ය. (        )

- **A හා B තීරු නිවැරදිව යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| (11) | බුලත්ගම ධර්මාලංකාර සිරිසුමන තිස්ස හිමි. | A | උදයභානු පුවත්පත ආරම්භ කිරීම |
| (12) | අනගාරික ධර්මපාල තුමා | B | මුස්ලිම් නේෂන් සඟරාව ආරම්භ කිරීම |
| (13) | ආරුමුග නාවලර් තුමා | C | මහාබෝධි සඟරාව ආරම්භ කිරීම |
| (14) | සිද්දි ලෙබ්බේ මහතා | D | මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීම |
| (15) | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි | E | බෞද්ධයන් සඳහා මුද්‍රණාලයක් පිහිටුවීම |

- **16 - 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

(16) ලන්දේසීන් සමඟ ක්‍රි.ව. 1638 ගිවිසුම අත්සන් කළ උඩරට සිංහල රජතුමා වන්නේ,

(1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (2) සෙනරත් රජු

(3) දෙවන රාජසිංහ රජු (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(17) 1815 වර්ෂයේ මාර්තු මස දෙවන දින මහනුවර මඟුල් මඩුවේ දී උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර එහි ඔසවා තිබූ ඉංග්‍රිසි කොඩිය බිම හෙලා නැවතත් සිංහ කොඩිය ඔසවන ලද අභීත භික්ෂූන් වහන්සේ වන්නේ,

(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (2) වාරියපොල සුමංගල හිමි

(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (4) වලානේ සිද්ධාර්ථ හිමි

(18) ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවන සමයේ පොන්නම්බලම් රාමනාදන් මහතා වැදගත් වීමට හේතු වූයේ මින් කුමන සිදුවීම ද?

(1) පරමේෂ්වර විද්‍යාලය පිහිටුවා හින්දු දරුවන්ගේ අධ්‍යාපන උන්නතියට ක්‍රියා කිරීම.

(2) කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම.

(3) යාපනයේ ශිවංගල විද්‍යාලය ආරම්භ කිරීම.

(4) පොත්පත් මුද්‍රණය සඳහා මුද්‍රණාලයක් පිහිටුවීම.

(19) ඉන්දියාවේ සිපෝයි කැරැල්ලට ආසන්නතම හේතු වූයේ,

(1) ඉන්දියාවේ දේශීය කර්මාන්ත අභාවයට යාම

(2) ස්වදේශිකයන්ගේ ඇදහිලි හා විශ්වාස නොසලකා හැර ක්‍රිස්තියානි ආගම පැතිර වීමට ඉංග්‍රීසීන්ගේ සහාය ලැබීම.

(3) ඉංග්‍රීසීන් ඉන්දියානු ප්‍රදේශ අත්පත් කර ගැනීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති.

(4) ඌරුතෙල් හා ගවතෙල් මිශ්‍ර ග්‍රීස් තැවරූ පතරොම් සිපෝයි හමුදාවේ භාවිතයට දීම.

(20) ඉංග්‍රීසින්ගෙන් තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන් විසින් ක්‍රි.ව. 1919 වර්ෂයේ දී පිහිටුවා ගත් ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ,

(1) සිද්දි ලෙබ්බේ මහතා (2) පොන්නම්බලම් අරුණාචලම් මහතා


(3) පොන්නම්බලම් රාමනාදන් මහතා (4) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- තවත් ප්‍රශ්න 4කට ද පිළිතුරු සපයන්න.

(01) (i) ලංකා ආකෘති සිතියම මත A B C D E හා F නමින් දක්වා ඇති ස්ථාන නාම කවරේදැයි වරහන තුළින් තෝරා තිත් පෙළ මත ලියන්න.

(ගාල්ල, කල්පිටිය, මහනුවර, මන්නාරම, කොළඹ, ත්‍රිකුණාමලය)




(ලකුණු 06)

(ii) (A) දී ඇති පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මෙතුමාගේ නම කුමක් ද?

.....................................................................................................

(ii) මොහු කුමන ජාතියෙක් ද?

.....................................................................................................

(iii) මෙතුමා සමඟ ලංකාවට පැමිණි කාන්තාව නම් කරන්න.

..................................................................................... (ලකුණු 03)



A - රූපය

(iii) (B) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය නම් කරන්න

.....................................................................................................

(ii) මෙය කරවන ලද රජු කවුද?

.....................................................................................................

(iii) මෙම නිර්මාණය ඉදි කොට ඇති රට කුමක්ද? (ලකුණු 03)

.....................................................................................................



B රූපය

(02) (i) A - ලන්දේසීන්ගේ මව් රට කුමක්ද?

B - ලන්දේසීන් විසින් පෙරදිග පිහිටුවාගත් වෙළෙඳ සමාගම නම් කරන්න. (ලකුණු 02)

(ii) ලන්දේසීන්ගේ මෙරට භාෂාවලට එක් වූ වචන රාශියකි. ඉන් ගෘහ නිර්මාණ හා ගෘහ භාණ්ඩ වශයෙන් අප සමාජයට එක් වූ ලන්දේසි වචන හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) A - ලන්දේසීන් යටතේ මෙරට පැවති ප්‍රදේශ බෙදා දැක් වූ කොමාන්ඩරි තුන නම් කරන්න.

B - ලන්දේසීන් විසින් මෙරටට හඳුන්වා දුන් උසාවි පද්ධතියට අයත් උසාවි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 06)

(03) (i) ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ද්විත්ව පාලනය පැවති කාල වකවානුව ලියන්න (ලකුණු 02)

(ii) ඉංග්‍රීසි පාලන සමයේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය සඳහා පත් කොට එවූ ආණ්ඩුකාරවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේ දී රජු හා රදලයන් අතර ඇති වූ අර්බුද තුනක් නම් කරන්න. (ලකුණු 06)

(04) (i) ඉංග්‍රීසින් මෙරටින් ලබාගත් වටිනාම කුළු බඩු වර්ගය හා කුළු බඩු නොවෙන වෙනත් වටිනා වෙළෙඳ ද්‍රව්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉංග්‍රීසින්ට එරෙහිව ක්‍රි.ව. 1797 දී ඇති වූ මුහුදු බඩ කැරැල්ලට බලපෑ බදු වර්ග දෙකක නම් ලියන්න. (ලකුණු 04)

(iii) ඉංග්‍රීසින්ට එරෙහිව මෙරට ඇති වූ මුල්ම උඩරට සටන වන ක්‍රි.ව. 1818 සටන අසාර්ථක වීමට හේතු තුනක් ලියන්න. (ලකුණු 06)

(05) (i) මිෂනාරීන් විසින් මෙරට සිය ආගම ප්‍රචාරය සඳහා මුද්‍රණය කරන ලද ප්‍රකාශන දෙකක නම් ලියන්න. (ලකුණු 02)

(ii) බ්‍රිතාන්‍ය පාලනසමයේ දී ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සඳහා මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගෙන් මෙරට බෞද්ධ ආගමික පුනර්ජීවනය සඳහා ඉටු වූ සේවාවන් තුනක් නම් කොට ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) A - ඉංග්‍රීසින් විසින් මෙරටට හඳුන්වා දුන් ප්‍රථම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නම් කරන්න.

B - කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක සභාවට පත් වූ ප්‍රථම උගත් ලාංකිකයා කවුද? (ලකුණු 02)

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ මෙරටට හඳුන්වා දුන් කාරක සභා හතෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 06)

(07) (i) ඉන්දියාවේ ආගමික පුනර්ජීවනය සඳහා මුල් වූ සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ කැපී පෙනෙන නායකයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 04)

(iii) මහත්මා ගාන්ධි තුමා ලොවටම ආදර්ශයක් ලබා දුන් අවිහිංසාවාදී නායකයෙකි. එතුමා විසින් ඉන්දියාවට නිදහස ලබා ගැනීමේ අරමුණින් ගෙන යන ලද විරෝධතා ව්‍යාපාර තුනක් නම් කරන්න. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## ඉතිහාසය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (01) | ස්පිල් බර්ජන් | (11) | E |
| (02) | කෝපි | (12) | C |
| (03) | මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | (13) | A |
| (04) | බොම්බාය | (14) | B |
| (05) | ඩොනමෝර් | (15) | D |
| (06) | ✓ | (16) | 3 |
| (07) | ✗ | (17) | 2 |
| (08) | ✓ | (18) | 1 |
| (09) | ✗ | (19) | 4 |
| (10) | ✓ | (20) | 2 |

(ලකුණු 40)

### II පත්‍රය

(01) (i) A මන්නාරම
B කල්පිටිය
C කොළඹ
D ත්‍රිකුණාමලය
E මහනුවර
F ගාල්ල (ලකුණු 06)

(ii) A (i) කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
(ii) ඇමරිකානු
(iii) හෙලේනා බ්ලැවැට්ස්කි මැතිණිය (ලකුණු 03)

(iii) B (i) ටජ්මහල
(ii) සාජහාන් රජු
(iii) ඉන්දියාව (ලකුණු 03)

(02) (i) A ඕලන්දය B VOC සමාගම (ලකුණු 02)

(ii) සොල්දර, තරප්පු, බාල්ක, ජනේල, කාමර, ඉස්තෝප්පු, ඉස්කුරුප්පු, අල්මාරි (ලකුණු 04)

(iii) A කොළඹ කොමාන්ඩරිය, ගාලු කොමාන්ඩරිය, යාපන කොමාන්ඩරිය
B රාද් වැන්, සිවිල් රාද්, ලැන් රාද්, පිස්කල් උසාවි (ලකුණු 06)

(03) (i) ක්‍රි.ව 1798 - 1802 දක්වා (ලකුණු 02)

(ii) පෙඩ්රික් නෝර්ත්, තෝමස් මෙට්ලන්ඩ්, රොබට් බ්‍රවුන්රිග් (ලකුණු 04)

(iii)
- ඇතැම් රදලවරුන්ට පැවරී තිබූ රාජකාරි තම ඥාතීන් වූ නායක්කාර වංශිකයන් වෙත පැවරීම
- රටවැසියන්ට හිංසා පීඩා කළ රදළවරුන්ට රජු දඬුවම් පැමිණ වීම
- තමා බලයට පත් කිරීමට ක්‍රියා කළ පිළිමතලව්වේ මහා අධිකාරම්ට මරණ දණ්ඩනය නියම කිරීම.
- රදලවරු අතර අර්බුද ගොඩනැගෙන ඇයුරින් තනතුරු ලබාදීම (ලකුණු 06)

(04) (i) කුරුඳු, මුතු මැණික්, අලි ඇතුන් (ලකුණු 02)

(ii) පොල්ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද (ලකුණු 04)

(iii)
- සටන විධිමත් ලෙස සංවිධානය වී නොතිබීම
- ඉංග්‍රීසින්ගේ දැඩි මර්දනකාරී ප්‍රතිපත්තිය
- සටන මෙහෙය වූ නායකයන් අතර තිබූ අමනාපකම්
- ඉංග්‍රීසින්ගේ ආයුධ ශක්තියට මුහුණ දීමට නොහැකි වීම
- රජු ලෙස පෙනී සිටි දොරේසාමි නැමැත්තා නියම දොරේසාමි නොවන බව හෙළි වීම (ලකුණු 06)

(05) (i) මාසික තෑග්ග, උරගල, ලංකා නිධානය (ලකුණු 02)

(ii) ලන්ඩන් මිෂනාරි, බැප්ටිස්ට් මිෂනාරි, වෙස්ලියන් මිෂනාරි , ඇමරිකන් මිෂනාරි, චර්ච් මිෂනාරි (ලකුණු 04)

(iii)
- බෞද්ධ පාසල් ආරම්භ කිරීම
- ඉරුදින දහම් පාසල් ඇරඹීම
- වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කිරීමට පුරෝගාමී වීම
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමට දායක වීම.... ආදී (ලකුණු 06)

(06) (i) A - කෝල්බෲක් ප්‍රතිසංස්කරණය

B - පොන්නම්බලම් රාමනාදන් (ලකුණු 02)

(ii) ස්වදේශ කටයුතු, කෘෂි කර්මය හා ඉඩම්, පළාත් පාලනය, සෞඛ්‍ය, අධ්‍යාපනය, කම්කරු, කර්මාන්ත සහ වෙළඳාම, ගමනාගමනය හා පොදු වැඩ (ලකුණු 04)

(iii)
- ආණ්ඩුකාර ධූරය අහෝසි කොට අග්‍රාණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කිරීම
- ද්වි මණ්ඩල පාර්ලිමේනතුවක් පිහිටුවීම
- අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම
- රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම (ලකුණු 06)

(07) (i) බ්‍රහ්ම සමාජය, ප්‍රාර්ථනා සමාජය, ආර්ය සමාජය, අහමඩියා, අලිගාර් (ලකුණු 02)

(ii)
- දඩාභායි නාඕරෝජි
- සුරේන්ද්‍රනාත් බැනර්ජි
- බාල් ගංගාධාර් තිලක්
- මහත්මා ගාන්ධි
- මවුලානා අබුල් කලාම් අසාද්
- ජවහර්ලාල් නේරු (ලකුණු 04)

(iii)
- සත්‍යග්‍රහ ව්‍යාපාරය
- සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය
- සහයෝගිතා වර්ජන ව්‍යාපාරය
- ඉන්දියාවෙන් ඉවත් වෙනු ව්‍යාපාරය......ආදී (ලකුණු 06)